## ජගත් ජේ එදිරිසිංහ

# පිපිණි

### පළමු කොටස

සිත එකඟ කර ගනිමින් තව දුරටත් වාහනය පැදවිය නොහැකි බවක් නිමන්තට දැනුණි. යාබද අසුනේ වාඩිවී සිටින බිරිඳ දෙස නොබලාම ඔහු වාහනය පාර අයිනට ගත්තේ ය.

මෙතෙක් වේලා ගල් පිළිමයක් සේ ඉදිරිය බලා සිටි අමන්දි විමතියෙන් සැමියා දෙස හැරී බැලුවා ය. ඇගේ බැල්ම නොතකා හරිමින් නිමන්ත වාහනය තණ බිස්සේ නවත්වා සුක්කානමට හිස තබා ගත්තේ ය. ඔහු හඬන්නේ යයි ඇයට සිතුණි. ඇගේ සිතේ ඇති වූයේ අප්‍රසාදයකි. ඒ හැඟීම සඟවා ගන්නට ඇය කිසිදු උත්සාහයක් නොගත්තාය.

"පිස්සු නටන්න එපා..." ඈ නොරිස්සුම් ස්වරයකින් කීවේ ඒ නිසා ය.

ඔහු කිසිවක් නොකීවේ ය. අමන්දි තවත් විනාඩියක් පමණ ඔහු දෙස බලා සිටියා ය.

"ඔයා ඔය තරම් දුර්වල විදිහට හැසිරෙනකොට මම හිත හදාගන්නෙ කොහොම ද...?"

ඇගේ කටහඬෙහි රැඳුණ කෝපය ඔහුට මනාව දැනුණි. හිස ඔසවා ඇය දෙස බලනු නොහැකිව ඔහු සිටි ඉරියව්වෙන්ම බොහෝ වේලා සිටියේ ය.

අමන්දි කාරයේ දොර ඇරගෙන බිමට බසිනු ඔහුට ඇසුණි. ඔහු හිස ඔසවා බලන විට ඕ ඈත උද්‍යානය දෙස බලා සිටියා ය. දෑත් බැඳගෙන ගල් පිළිමයක් සේ සිටගෙන සිටි ඇගේ දසුන ඔහු සිත වේදනාව තවත් වැඩි කළේ ය.

දෑස් වල එක් වූ කඳුළු පිටි අත්ලෙන් පිස ගනිමින් නිමන්ත කාරයෙන් බැස්සේ ය. බිමට නැඹුරු කරගත් හිසින් යුතුව පිය මැන ගොස් සිය බිරිඳ අසළින්ම සිට ගත්තේ ය.

"අයෑම් සොරි..." ඔහු ඇය දෙස නොබලාම කිව්වේ ය. ඈ උරහිස් ගැස්සුවා මිස පිළිතුරු වචනයක් නොකීවා ය. සැබෑ ලෙසම කම්පනයට පත්විය යුතු ඇය මහත් ධෛර්යයකින් නැගී සිටියදී තමා දුර්වල ලෙස ඇද වැටීම ඔහු සිත ලැජ්ජාවට පත් කළේ ය.

"මට ඒක දරාගෙන ඉන්න බැහැ අමා" ඔහු මිමිණුවේ ය. ඈ ඔහු බස නෑසුණා සේ ඉවත බලාගත්වන ම සිටියා ය.

"මට හරිම කණගාටුයි මේක කියන්න සිදුවීම ගැන... ඒත් ඔය දෙන්නම මේ ගැන දැනුවත් වෙලා ඉන්න ඕනෙ..." මෙයට පැයකට පෙර වෛද්‍ය සිරිමාන්න කී වචන ඔහුගේ සිතේ තවමත් රැව් පිළිරැව් දෙයි.

"කැන්සර් එක අපි හිතුවට වඩා ශරීරය තුළ හුඟක් පැතිරිලා... අමන්දි... අපි මේ කරන ප්‍රතිකාර ගැන විශ්වාසය තියමු... ඉස්සර වගේ නෙවෙයි.. දැන් ප්‍රතිකාර ක්‍රම දියුණුයි.. මේ ප්‍රතිකාර වලින් යමක් නොවුණොත්..." වෛද්‍ය සිරිමාන්න කතාව නවතා අමන්දිගේ මුහුණින් සිය බැල්ම ඉවතට ගත්තේ ය.

"මට ඇත්ත ම කියන්න ඩොක්ටර්' අමන්දි කීවා ය.

වෛද්‍යවරයා සිය බැල්ම නිමන්තගේ මුහුණ මත රැඳෙව්වේ ය. තරුණ සැමියාගේ වික්ෂිප්ත බැල්ම මඳ වේලාවක් නිරීක්ෂණය කළ ඔහු නැවත අමන්දි දෙසට හැරුණේ ය.

"ඒක හරි අමන්දි... අපි රියැලිටි එකට මුහුණ දෙන්න ඕනෙ... මේ ප්‍රතිකාර වලින් වෙනසක් නොවුණොත් ... අමන්දි... අමන්දි... ඔයාට තියෙන්නේ ඉතාම කෙටි කාලයක්"

තරුණියගේ දෑස් යන්තමින් සසළවිය.

"හිත අධෛර්ය කරගන්න එපා..." ඔහු කීවේ ය. ඇගේ දෑස් කඳුලින් පිරෙනු ඔහු දුටුවේ ය. ඔහු මේසය කෙළවරක වූ කඩදාසි ලේන්සු පෙට්ටිය ඇය වෙත පෑවේ ය. අමන්දි එයින් ඇදගත් කඩදාසියකින් දෑස් වල කඳුළු පිසදා ගත්තා ය. විනාඩියක පමණ නිහඬතාව කල්පයක් සේ නිමන්තට දැනුණි. ඒ කල්පය අවසන ඕ හිස ඔසවා වෛද්‍යවරයා දෙස බැලුවා ය.

"මම මැරෙන්න බය නෑ ඩොක්ටර්" ඇගේ ඒ වචන වෛද්‍යවරයා කිසි ලෙසකින් වත් බලාපොරොත්තු නොවූ තරම් දැඩිව ඇසුණි.

"හිත අධෛර්ය කරගන්න ඕනෙ නැහැ... සුබවාදී විදිහට හිතමු" ඔහු කීවේ ඇගේ සිතට සහනයක් ගෙනදෙනු සඳහා ය.

අමන්දි වෛද්‍යවරයා දෙස එක එල්ලේ බැලුවා ය.

"මං හාස්කම් විශ්වාස කරන්නේ නැහැ ඩොක්ටර්... යමක් වෙන්න නියමිතව තියෙනවා නම් මං ඒකට මුහුණ දෙන්න ලෑස්තියි..." ඈ කිවා ය...

"ඒක හරි... ඒත් අපට පුලුවන් දිගටම මේ ප්‍රතිකාර කරගෙන යන්න... මං කලිනුත් කිව්වනෙ.. දැන් ඉතාම දියුණු ප්‍රතිකාර ක්‍රම තියෙනවා.. අපි බලාපොරොත්තු අත්හැර ගන්නෙ නැතිව ඉඳිමු..." වෛද්‍යවරයා ඒ අවසාන වචන කීවේ තමන් අස්වැසීම සඳහා යයි නිමන්තට දැන් සිතෙයි.

උද්‍යානයේ ඈත සිට හමා ආ සුළඟකින් කැළඹුණ පරඬැල් රැසක් සුළියක් සේ අහසට නඟිනු අමන්දිට පෙනුණි. පරඬැල් දූලි වළාවෙන් බෝගන්විලා මල් පොකුරු මොහොතකට වැසී ගියේ ය. ඈ කිසිදු අරමුණකින් තොරව ඒ දෙසම බලා සිටියා ය. දෛවය විසින් තමාට යමක් නියම කරදෙනු ලැබ ඇත්නම් එයට මුහුණ දෙනවා විනා වෙනයම් විකල්පයක් නැති බව ඇයට දැනෙයි. ඒ යතාර්ථයට මුහුණ දෙන්නට ඇය සිත හදා ගනිමින් සිටියා ය.

ඈ තමා අසළින් සිටගෙන සිටින නිමන්ත දෙස බැලුවා ය. ඔහු පිළිබඳ උපන් කණගාටුවකින් ඇගේ සිත මො- ) සසළ විය. ඈ සිය වමතින් ඔහුගේ දකුණත

> දුක් වෙන්න එපා.. මට මේ ලෝකෙ එක දෙයක් ඇරෙන්න දාලා යන්න බැරි දෙයක් නැහැ.. ඒ ඔයා.. මට ඔයා දාලා යන්න දුකයි.. ඒත් මම ඒකට හිත හදා ගන්නවා.. කොහොම හරි.. ජීවිතේ කවදා හරි අපිට මේ ගමන යන්න වෙනවාමයි.. එකම වෙනස මට ටිකක් කලින් යන්න වෙන එක විතරයි..

අල්ලා ගත්තා ය.

"දුක් වෙන්න එපා.. මට මේ ලෝකෙ එක දෙයක් ඇරෙන්න දාලා යන්න බැරි දෙයක් නැහැ.. ඒ ඔයා.. මට ඔයා දාලා යන්න දුකයි.. ඒත් මම ඒකට හිත හදා ගන්නවා.. කොහොම හරි.. ජීවිතේ කවදා හරි අපිට මේ ගමන යන්න වෙනවාමයි.. එකම වෙනස මට ටිකක් කලින් යන්න වෙන එක විතරයි.." අමන්දි මිමිණුවා ය.

ඔහු කිසිවක් නොකීවේ ය. කතා කරගන්නට බැරි ලෙස ඔහු ගොළු වී සිටියේ ය. තමාගේ අතැඟිලි අතර දැවටෙන ඇගේ සීතල ඇඟිලි පහස ගැන පමණක් සිතමින් ඔහු ඇය අසළින් ම සිටගෙන සිටියේ ය.

"අමා.." බොහෝ වේලාවකට පසු ඔහු කතා කළේ ය. "මට.. මට.. ඔයා නැතිව ඉන්න බැහැ.." ඔහු කඳුළු සඟවන්නට උත්සාහ ගනිමින් ඇය තරයේ වැළඳ ගත්තේ ය. ලොවම නතර වූ සෙයක් දැණින. ඔවුනගේ ඉකිබිඳුම විනා අන් කිසිවක් නෑසුණි. සියදහසක් සිතුවිලි ඉපදෙන්නට මිය යන්නට ඉඩ දෙමින් කොපමණ කාලයක් ගෙවී යන්නට ඇද්ද? කඳුළු පිසදා ගත් අමන්දි හිස එසවූවාය. නිමන්ත කඳුළු පිරි දෙනෙතින් ඈත හිස් අහස දෙස බලා සිටිනු ඈ දුටුවා ය.

"නිමන්ත .. දුක් වෙන්න එපා.. මගෙ හිතටත් ධෛර්යයක් වෙන්න, ඔයා ශක්තිමත්ව ඉන්න ඕන වෙලාවක් මේ. මට උදව් කරන්න... මගෙ හිත හදා ගන්න මට උදව් කරන්න."

නිමන්ත සුසුමක් හෙලුවේ ය.

"ඔයාට ඉක්මණින් සනීප වෙයි අමා. අපි ඒ වෙනුවෙන් කරන්න පුළුවන් හැම දෙයක්ම කරමු. මම ඒ වෙනුවෙන් කරන්න පුළුවන් හැම දෙයක්ම කරනවා. මම කොහොම හරි ඔයාව සනීප කර ගන්නවා."

අමන්දි දඟකාර ලෙසින් සිය දකුණතින් ඔහුගේ හිසකෙස් අවුල් කර දැමුවා ය ඔහුගේ මුහුණට එබී බැලුවා ය

"අනේ මගේ හොඳ නිමන්ත.. විහිලු කතා කියන්න එපා.. මොකටද අපි බොරුවට හිත් රවටාගන්නෙ..? මං පොඩි බබෙක් නෙවෙයිනෙ.." ඇය කඳුළු අතරින් සිනාසෙන්නට වෑයම් කළාය. "අපි ගෙදර යමු..."

වාහනයට ගොඩවුණ අමන්දි අසුනේ පහසුවට ඇළ වී දෑස් පියා ගත්තා ය.

ජීවිතය පිළිබඳ බොහෝ දේ නැවත නැවත සිහියට එයි. අනාගතය පිළිබඳ කළ සියලු සැළසුම් සිය දෑස් අබියස බිඳ වැටෙනු ඇති බව නිමන්තට විශ්වාස ය. මේ සියල්ල ඉදිරියේ අසරණව බලා සිටිනු විනා වෙන කළ හැකි අන් යමක් තමාට නැති බව නිමන්ත දනියි. වචනයෙන් විශ්වාස කළ නොහැකි අසරණ කමකින් තම සිත වැසී යනු ඔහුට දැනෙයි. මේ අසරණ කම කෙසේ නම් දරාගන්න ද?

බියකරු තිරිංග හඬක් සමගින් වාහනය නැවතෙයි. අමන්දි ඇර බලන්නේ බිය රැඳි මුහුණින් ය. "නිමන්ත.... මොකද මේ..?" ඈ කෑගැසුවා ය.

අනෙක් පසින් ආ වාහනයේ රියැදුරා අත දිගු කර යමක් කියනු ඔහුට පෙනුණි. එය පරුෂ වචනයක් බව ඔහු දනියි. අමන්දිට එය නෑසීම සහනයකි. අසළ රැඳි බොහෝ දෙනෙකුද විමතියෙන් බලා සිටියදී නිමන්ත ගියරය මාරු කර රථය ඉදිරියට ගත්තේ ය.

තමා අනවශ්‍ය ලෙස කලබල වී සිටින්නේදැයි සිතා බලන්නට ඔහු වෙහෙස විය. මෙය කලබල විය යුතු මොහොතක් නොවේ. ඉදිරියට ඇත්තේ ඉවසීම සහ දරා සිටීම පිළිබඳ පරීක්ෂණයකි. ඉතා අපහසු පරීක්ෂණයකි. තමා මේ පරීක්ෂණයෙන් කොයි තරම් දුරට සමත් වේදැයි නිමන්තට සිතා ගත නොහැකි ය.

සියල්ල යහපත් අතට හැරෙනු ඇතැයි යන සුබවාදී සිතිවිල්ලෙන් සිත රවටා ගත යුතු යයි ඔහු සිතුවේ ය. එය සැම අතින්ම යහපත් ය.

000000

අමන්දි රාත්‍රිය පුරාම සුසුම් හෙළණු අවදියෙන් සිටි නිමන්ත ට ඇසුණි. ඇය දෙසට හැරී යමක් කියා ඇය අස්වසන්නට, ඈ හිස තම උරතලා උණුසුමෙහි රඳවා සනසවන්නට, වරෙක සිතුණ ද ඔහු ඒ සිතුවිල්ල වළක්වා ගත්තේ ය. අමන්දි ගෙන් යමක් අසන්නට ධෛර්යයක් තමා තුළ නැතැයි ඔහුට සිතුනි.

කනප්පුව මත ඇති ඩිජිටල් ඔරලෝසු මුහුණතේ රාත්‍රී දෙකේ කනිසම රතු පැහැයෙන් දැල්වෙමින් තිබෙයි. නිමන්ත නැගිට ඇඳ මත වාඩි වූයේ ය. අමන්දි ගේ සීතල අතේ පහස ඔහු පිට මත තැවරුණි.

"නින්ද ගියේ නැද්ද..?" අමන්දි පහත් හඬින් ඇසුවා ය.

"නැහැ.."

"කල්පනා කරන්න එපා.." ඕ කීවා ය ඔහු පිළිතුරක් නොදුන්නේ ය. "..මම තේ එකක් හදලා දෙන්න ද..?" අනතුරුව ඇය ඇසුවා ය.

"එපා.. ඔයා නිදාගන්න බලන්න.." ඔහු කීවේ ය. අමන්දි අපහසුවෙන් සිනාසුණා ය.

"එන්න මා ළඟ ට.." ඈ කීවා ය. ඔහු ඇය දෙස බැලුවේ විමතියෙනි.

"ඔයා නිදා ගන්න.." ඔහු කීවේ ය.

"අදට විතරක් එන්න මා ළඟට.. අදට විතරක්.." අමන්දි සිහින් හඬින් කීවා ය. "..ආයෙම කවදාවත් මා ළඟට එන්න එපා.. කවදාවත් එන්න එපා.." ඕ ඇඳ හරහා ඇදීවිත් ඔහුගේ

උණුසුමට ගුලි වූවා ය. ".. අදට විතරක් එන්න මා ළඟට.."

"පිස්සු කියන්න එපා.." නිමන්ත ඇගේ හිස සිප ගත්තේ ය. "..ඇයි මේ..?"
".. මට ඔයා ගැන දුකයි.. මට ඔයාගෙන් ඈත් වෙන්න ඕනෙ නිමන්ත.. හුඟක් ඈත් වෙන්න ඕනෙ..."

ඇගේ කඳුලේ සිසිලස තම පපුව මත තැවරුණු නිමන්තට දැනුණි. ඔහු ඉතා සීරුවෙන් ඇය තුරුලු කර ගත්තේ ය. ඕ හිස ඔසවා ඔහුගේ දෙතොල මත සිය දෙතොල තැබුවා ය. මල් පෙත්තක් වන ඇගේ දෙතොලේ සිනිඳු පහස ඔහු මහත් ලෝබ කමකින් විඳ ගත්තේ ය.

".. මේ මං ඔයාට දෙන අන්තිම හාදුවයි.. ආයෙ කවදාවත් නැහැ.." වෙවුලන දෙතොලතරින් ඇය මුමුණනු ඔහුට ඇසුණි.

000000000

නිමන්ත උදෑසන අවදි වන විට අමන්දි ඇඳෙහි නොසිටියා ය. මුළුතැන් ගෙය දෙසින් ඇය තේ සාදන ශබ්දය ඔහුට ඇසුණි. නැගිට ඈ පිටුපසින් ගොස් ඇය වැළඳ ගන්නට ඔහුට සිතුණි. ඒ සිතුවිල්ල සිත දරාගෙන ම නිමන්ත ඇහුම් කන්දීගෙන සිටියේ ය.

තේ සාදන ශබ්දයෙන් විනාඩියකට පමණ පසු ඉදිරි දොර විවර වන වැසෙන හඬ ඔහුට ඇසුණි. අමන්දි ගේ කාරය පණ ගැන්වෙනු අනතුරුව ඇසුණි.

සාලයේ මේසය මත නිමන්ත ගේ තේ කෝප්පය විය. ඔහු එය අතට ගත්තේ ය. තේ කෝප්පයට යට කොට තබා තිබූ කුඩා කොළ කැබැල්ල ඔහු දුටුවේ එවිට ය.

"මම එළියට යනවා" අමන්දි ගේ අත් අකුරින් ලියා තිබුණි.

නිමන්තගේ සිතේ ඇති වූයේ කණගාටුවකි. ජීවිතයේ පළමු වතාවට ඇය ඔහුට නොකියා ම පිටව ගොස් තිබුණි. මෙතුවක් කාලයක් සෑම උදයකම "පරිස්සමින් ඉන්න.. බුදු සරණයි.." කියූ අමන්දි කිසිවක් නොකියා ම පිටව ගොස් තිබුණි.

අමන්දි නිවසෙන් පිටව ආවේ කිසිදු නිශ්චිත අරමුණකින් නොවේ. කොතැන යා යුතුදැයි කිසිදු අරමුරණකින් තොරව ඈ රිය පැදවූවාය. කල්පනාවේ නිමග්නව කැළණිය දෙසට මෝටර් රථය හැරවූ ඈ ටික වේලාවකින් කැළණිය රජ මහා විහාරය අසළ ඇති රථ ගාලෙහි තම රිය නතර කොට මොහොතක් එලෙසම සිටියාය. පෙරදා ඇය විසින් අසන ලද අම්හිරිම ආරංචියෙන් සසළ වූ සිත නිවාගන්නට ඒ අප්‍රසන්න හැඟීමෙන් අත් මිදෙන්නට ඇයට අවශ්‍යව තිබුණි. සිත ශක්තිමත් කර ගන්නට ඇයට අවශ්‍යව තිබුණි.

ජීවිතයේ ප්‍රථම වතාවට නිමන්තගෙන් සමු නොගෙන නිවසින් පිටවීමට සිදුවීම පිළිබඳ කනස්සල්ල ද ඇගේ සිත පීඩාවට පත් කළේ ය.

"..පව් .. එයා කොහොමද මේක දරා ගන්නේ..." නිරායාසයෙන් දෙනෙත් පුරවන කඳුළු බිඳු වළකාලන්නට ඈ අපොහොසත් වූවා ය. අනුකම්පාවට සිත මෙළෙක් කරන්නට ඉඩ දිය යුතු නැත. මේ තරම් අසරණ වන්නට සිතට ඉඩ දිය යුතු නැත. මේ සියළු බැඳීම් වලින් මිදිය යුතුය. කිසිවකු කෙරෙහි හෝ කිසිවක් කෙරෙහි හෝ ආශාවක් ඇත්නම් ඒ සියල්ල අවසන් කළ යුතු ය. එය කළ හැකි ය. එය කළ යුතු ය.

පන්සල තුළට යා යුතු ය යන ක්ෂණික සිවිල්ලෙන් ඇය වාහනයෙන් බැස්සා ය. අසළ සිටි මල් විකුණන දරුවකු වෙත ළං වූ අමන්දි ඈ අත වූ මල් කූඩයට එබී බැලුවා ය.

"...මට මේ මානෙල් මල් ටික දෙන්න...." ඈ රුපියල් සියයක නෝට්ටුවක් දරුවා අත තැබුවා ය. දිය බිඳු තැවරුණ නිල් මානෙල් මල් පොකුර දෑතින්ම ගත් ඇගේ සිතට සතුටක් දැනුණි. තමා වඩාත්ම ප්‍රිය කරන නිල් මානෙල් මල් පොකුර දෑතින් දරා ඕ මොහොතක් එහි රූව වින්දා ය.

" ..නෝනා.... ඉතුරු සල්ලි ..?" ඉතිරි මුදල් දෙන්නට දැරිය ඇය පසුපසින් දුව එයි.

"ඒ සල්ලි ඔයාට.." අමන්දි දැරියගේ හිස මත සිය දකුණත තබා කියයි. විහාරය වෙත යන්නට පියගැට පෙළ නගින අමන්දි ආපසු හැරී බලන විටත් දැරිය පියකරු සිනාවකින් සරසාගත් මුවින් යුතුව ඈ දෙසම බලා සිටිනු දකියි.

කැළණි ගඟ දෙසින් සිසිල් සුළඟක් හමා එයි. ගමන මඳකට නවතා ඒ සිසිලස විඳ ගන්නට ඇය උත්සාහ කළා ය මේ පුණ්‍ය භූමියේ සුළඟද සිතට සැනසුමක් එක් කරන්නේ යයි අමන්දිට සිතුණි.

විහාර බිම නිස්කලංක ය එදින සතියේ දිනයක් නිසා විය යුතු ය.

අමන්දි ප්‍රථමයෙන්ම චෛත්‍යයට මල් පූජා කළා ය. ඇය විහාර ගෙයට පියමැන්නේ මානෙල් මල් දෙකක් ද අතැතිවය. මේ විහාර ගෙය තුළ ඇවිදිමින් කාලය ගෙවන්නට අමන්දි සැමදා ප්‍රිය කළා ය. නිමන්ත හා විවාහ වූ අලුත ඔහු කන්කෙඳිරිගාමින් බලා සිටියදී ඇය විහාර ගෙය සැරසූ මේ අපූරු සිතුවම් වරු ගණන් රස වින්දා ය.

"මං කවදා හරි දවසක මේ වගේ අඳින්න පුරුදු වෙනවා" ඇය කී වතාවක් නම් නිමන්තට කියන්න ඇති ද? කවදා හරි දවසක...??? අනාගතයේ කරන්නට කොයි තරම් දේ සිතේ ගොඩ ගැසී තිබුණා ද? ඒ සියල්ල අමතක කර දමන්නට සිදුවීම කොයි තරම් අවාසනාවක් ද?

"සෝලියස් මෙන්දිස්ල එහෙම පහසුවෙන් පහළ වෙන්නෙ නැහැ.. ඒ වෙනුවෙන් ලොකු වෙහෙසක් අරන් අභ්‍යාස කරන්න වෙනවා.." නිමන්ත කී හැටි ඇයට සිහිවෙයි.

"ඒක තමයි මං අඳිනවා කියන්නෙ නැතිව අඳින්න පුරුදු වෙනවා කියල කිව්වෙ... සතත අභ්‍යාසය සාර්ථක කලාකරුවකු බිහිකරයි කියලා ඔයා අහලා නැද්ද..?"

"අප්පා.. බොහොම බර වචන.. හොඳයි හොඳයි වයසට ගියාම.. වෙන කරන්න වැඩක් නැති උනාම.. අඳින්න පටන් ගන්න.. මාත් ඔය බුලත් විටක් හරි හප හපා බලං ඉන්නම්කො..." නිමන්ත සිනාසෙයි. තමන් එදා සිටියේත් හරියටම මේ සිතුවම ඉදිරියේම බව අමන්දිට සිහි විය. දෛවය කොයි තරම් අකරුණාවන්තද? අසාධාරණ ද?

"මිස්.. කරුණාකරලා ඔයා පෝඩ්ඩක් එහාට වෙනවද?.. ඔයා ඔහොම ඉන්නකොට මට මේ ෆොටෝ එක ගන්න බැහැ.."

අමන්දි හැරී බැලුවා ය. තෙපාදයක් මත ඇටවූ කැමරාවක් පිටුපසට වී නොයිවසිල්ලෙන් තමා දෙස බලා සිටිනා තරුණයා ඇය දුටුවේ එවිට ය.

"සමාවෙන්න.." අමන්දි වහා පසෙකට වූවා ය.

"මටත් සමාවෙන්න ඔයාගෙ රසවින්දනයට බාදා කළා ට.. හුඟක් වෙලා බලා ඉඳලා බැරිම තැන තමයි කිව්වෙ.." ඔහු විනීත ලෙස කීවේ ය. "..අද මම මේ ෆොටෝස් ටික කොහොම හරි අරන් ඉවර කරන්න ඕනෙ.. මාසයක් දෙකක් ඇතුළත ඔක්කොම ඩ්‍රෝ කරන්න වෙලා තියෙනවා.."

අමන්දි සිනාසුණා ය.

"මම දැක්කෙ නැහැ ඔයා ඔතන ඉන්නවා.." ඕ කීවා ය.
තරුණයා එය නෑසුණා සේ සිය කාර්යයෙහි නිමග්නව සිටියේ ය.

".. මේ පින්තූර දිහා ඕනෙ තරම් වෙලා බලා ඉන්න පුලුවන්.." ඕ නැවත කීවා ය.
"ඒක ඇත්ත .." තරුණයා කැමරාව ක්‍රියාත්මක කරන අතර නොසැලකිලිමත් ලෙස කීවේ ය.
"රටක් වටිනා චිත්‍ර ශිල්පියෙකුගෙ රටක් වටිනා චිත්‍ර .."

අමන්දි ඔහුට පිටු පා මලසුන වෙත ගියා ය. තමා අත තිබූ නිල් මානෙල් මල් ඒ මත තබා දොහොත් මුදුන් දී වැන්දා ය. සියළු බැඳීම් වලින් සියළු තෘෂ්ණාවෙන් තමා නිදහස් කරන්නැයි සිතින් අයැද සිටියා ය. සියල්ල හැර යන්නට අවශ්‍ය ශක්තිය එක්තැන් කර දෙන්නැයි ඇය ඉල්ලා සිටියාය.

විහාර ගෙයින් පිටවන්නට පෙර ඇය නැවත හැරී බැලුවා ය තරුණයා තමා මලසුන මත තබා ආ නිල් මානෙල් මල් දෙක සිය කැමරාවට හසු කරගන්නට උත්සාහ කරමින් සිටිනු ඇයට පෙනුණි ඒ මන්දැයි විමසන්නට නොසිතාම ඕ ආපසු හැරී විහාරගෙයින් පිටවූවා ය

ලබන කලාපයට

Public Accountants for all your Taxation & Financial Accounting Needs

- Business Structuring & Development
- Tax Consulting, Tax Planning & Tax Returns
- Accounting services including Book keeping
- Superannuation
- GST/FBT & Other compliance work

JCB ACCOUNTING SERVICES

2011 TAX RETURNS

Nadee Weththasinghe CPA
B Com(Deakin) , M Tax (Melb), ATIA
Registered Tax Agent

PH: 03 9887 5160
Mob: 0425 700 315
Fax: 03 9887 5180
E-mail: nadee@jcbaccounting.com.au

CPA AUSTRALIA MFAA FULL MEMBER PLAN

Liability limited by a scheme approved under professional standard legislation

JCB FINANCIAL SOLUTIONS Pty Ltd
Authorised Credit Representative

Professional Advice on Your Choice of Loans & Lenders

- Home Loans
- Home Extensions / Renovation Loans
- Business Finance
- Investment Property Finance
- Refinance / Debt Consolidation
- Commercial Property Finance

HOME FOR SALE